# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධම්මදීප පදනම (සංස්ථාගත කිරීමේ)

**ධම්මදීප පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්
2015 නොවැම්බර් මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[24 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009425—225 (2015/11)

# ධම්මදීප පදනම (සංස්ථාගත කිරීමේ)

## ධම්මදීප පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

ධම්මදීප පදනම යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, ඒකී පදනමේ අරමුණු හා පරමාර්ථවලට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින්ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපතට හේතුවන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2015 අංක දරන ධම්මදීප පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ධම්මදීප පදනම සංස්ථාගත කිරීම.*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට ධම්මදීප පදනමේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ධම්මදීප පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ද, ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

*සංස්ථාවේ මූලික පරමාර්ථ.*

3. සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සිරිලක ධර්මද්වීපයක් ලෙස හා විනයගරුක සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම සඳහා, අධ්‍යාපනික සාමාජික සෞඛ්‍යය හා ආර්ථික පසුබිමක් සකස් කිරීම;

2—PL 009318—300 (2015/10)

(ආ) බුදු සසුනේ ආරක්ෂාව සුරක්ෂිත කරමින් නිති ශාසනික සේවාවන් පැවැත්වීම;

(ඇ) විවිධ ව්‍යාපෘතීන් යටතේ අසරණ සරණ සේවාවන් සැපයීම;

(i) අධ්‍යාපනික ගුණවගාවන් සඳහා;
(ii) ආර්ථික සංවර්ධන කටයුතු සඳහා;
(iii) ආර්ථික අපහසුකම් ඇති පාසල් දරු දැරියන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය වැනි ව්‍යාපෘතින් සඳහා.

(ඈ) ඈත ප්‍රදේශයන්හි වූ තවමත් නොදියුණු ගම්මාන කරා ගොස් ගම්වැසියන්ගේ එදිනෙදා දුෂ්කරතාවන් හඳුනා ගනිමින් විවිධ සහන සේවාවන් සැළසීම; සහ

(ඉ) ශාසනික හා ජාතික විපත් හඳුනා ගනිමින් ඒවා පිටු දැකීමට සුදුසු පිළිවෙත් සකස් කිරීම;

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් කටයුතු එනම්:—

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම හා දායක මුදල් ඉල්ලා ලබා ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයෙන් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම හා ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන මුදල්

5 වන වගන්තිය යටතේ යථා පරිදි තෝරා පත්කරගනු ලැබූ විධායක කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඇතුළත් වීම;

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, සේවයේ නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීම හා සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා හා පාරිතෝෂික දීමනා ගෙවීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා ආනුශංගික වන්නා වූ අවශ්‍ය හෝ අවස්ථානුකූලව අවශ්‍ය වන්නා වූ වෙනත් සියලු දේ කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** 1 සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කරගත් නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "උත්තර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

2 මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ උත්තර මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයින් සංස්ථාවේ ප්‍රථම උත්තර මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

3 සංස්ථාවේ ප්‍රථම අනුශාසකවරයා පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමියන් වන අතර, ඉහත (2) උප වගන්තිය ප්‍රකාරව පදනමේ උත්තර මණ්ඩලයේ අනෙකුත් ධුර දැරූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම උත්තර මණ්ඩලයේ අනුරූප ධූරයෙන් දරන්නන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම;

(ආ) උත්තර මණ්ඩලයේ තෝරා පත්කර ගැනීම උත්තර මණ්ඩලයේ නිලධරයන් ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත්හැරීම සහ උත්තර මණ්ඩලයේ බලතල, කාර්ය සහ සභාව ක්‍රියා කළ යුතු ආකාරය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය හා ඔවුන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම;

(ඈ) උත්තර මණ්ඩලයේ සංස්ථාවේ හෝ යම් අනු මණ්ඩලයක රැස්වීම සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම් කටයුතු කරගෙන යායුතු ආකාරයද ඇතුළුව රැස්වීම කැඳවීම, පැවැත්වීම පිළිබඳ කාර්යය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ සහ උත්තර මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත්වූ පදනමේ ව්‍යවස්ථා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට

සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ලැබිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**8.** මේ පනත යටතේ හා රීති යටතේ සංස්ථාව විසින් අත්කරගත් හෝ දරනු ලබන සියලුම චංචල හෝ නිශ්චල දේපල සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියලු මුදල් සංස්ථාවේ පරමාර්ථ ඉදිරියට ගෙනයාම සඳහා රීතිවලට අනුකූලව දැරීම, ප්‍රයෝජනයට ගැනීම හා යෙදවීම කළ යුතු ය. තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව, එම දේපල විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් ඉවත් කිරීම සඳහා පූර්ණ බලය ඇත්තේ ය.

විගණනය හා ගිණුම්.

**9.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

(ආ) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් විධායක සභාව විසින් තෝරාපත්කර ගනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** අනුශාසකවරයා සහ ලේකම්වරයා හෝ උත්තර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර

හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.**

11. සංස්ථාවේ කිසිම සාමාජිකයකුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවන්නේ ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

12. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.